**වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**
**---------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 30 දින හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 24 දින සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. |

**(ආ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සභාව සතු ඉඩම් 55 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | ඉඩම්වල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු වේ. |
| (ii) | වාහන 03 ක් සඳහා වටිනාකම තක්සේරු කර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් නොකිරීමෙන් වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දැක්වුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | වාහනවල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (iii) | මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති පුස්තකාල පොත්වල වටිනාකම තුළ පුස්තකාල පොත් 52ක සංඛ්‍යාවක්ද ඇතුළත්ව තිබුණි. නමුත් භෞතික වශයෙන් ඒවා දක්නට නොවීමෙන් වත්කම්වල වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | පුස්තකාල පොත් සම්බන්ධයෙන් අදාල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු වේ. |
| (iv) | 2019 වර්ෂයේ සභාවේ අරමුදල් මගින් රු.2,974,830ක වියදමින් ක්‍රියාත්මක කළ ආවලෙයි හින්දු සුසානභූමි අභ්‍යන්තර ඉදිකිරීම් සම්බන්ධිත වියදම්, මූලධන ස්වරූපයේ වියදමක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස නොදැක්වීම නිසා අදාල වටිනාකමින් වත්කම්වල වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. | කාර්යයන් අවසන් වූ වහාම මුළුමනින්ම වත්කම් ලෙස දැක්වීමට කටයුතු කරනු ලැබේ. | අදාල මූලධන වියදම, වත්කම්වල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුවේ. |

**1.4 අනුකූල නොවීම**

-----------------

**1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

-----------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය | වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කෙරේ. | අදාළ පනතේ විධිවිධානවලට අනුව වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 158 (1) වගන්තිය | හිඟ වරිපනම් බදු රු.526,081ක් ගෙවීම පැහැර හැරී පුද්ගලයන්ට සභාපතිවරයා විසින් වරෙන්තු නිකුත් කර නොතිබුණි. | හිඟ මුදල් අයකිරීමට වරෙන්තු නිකුත් කිරීමට කටයුතු කරමින් පවතී. | හිඟ වරිපනම් බදු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 371 | සභාව විසින් ලබාදුන් රු.289,104ක අත්තිකාරම් ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | නියමිත ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | අත්තිකාරම් සම්බන්ධයෙන් නියමිත මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. |
| | මුදල් රෙගුලාසි 571 | කොන්ත්‍රාත්කරුවන්ට ආපසු ගෙවිය යුතු රු.654,720ක ඇප තැන්පතු මුදල් සම්බන්ධයෙන් නියමිත ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නියමිත ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | ආපසු ගෙවිය යුතු තැන්පතු සම්බන්ධයෙන් නියමිත මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | උතුරු පළාත් මූල්‍ය චක්‍රලේඛය | | | |
| | 2017 මාර්තු 07 දිනැති අංක PE/01/2017 දරන චක්‍රලේඛය | පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ අධිකාරිබලය යටතේ අදාල වගකීම් පවරා ඇති නිලධාරීන් 06දෙනෙකු විසින් ඇප මුදල් රු.60,000ක් ගෙවා නොතිබුණි. | ඇප මුදල් ලබාගැනීමට කටයුතු කරනු ලැබේ. | සේවක ඇප මුදල් සම්බන්ධයෙන් උතුරු පළාත් මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව අවශ්‍ය කටයුතු සිදුකළ යුතු වේ. |
| | <u>රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ</u> 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | සභාවේ වාහන 10ක් වෙනුවෙන් ඉන්ධන පරිභෝජන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | අදාළ ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | වාහන අළුත්වැඩියා කිරීමෙන් පසුව සෑම වර්ෂයකම ඉන්ධන පරීක්ෂාවක් නියමිත කාලය තුළ සිදුකිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය | | | |
| (i) | 2018.01.24 දිනැති අංක 05/2018 (1)(අ) චක්‍රලේඛය මගින් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛය | ප්‍රජාව/ප්‍රතිලාභීන් සඳහා අපේක්ෂිත මහජන සේවාවන් ලැයිස්තුව සකස්කර ප්‍රදර්ශනය කර නොතිබුණි. | අදාළ ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව නියමිත කාලයේදි සකස් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 2018.01.24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය | සේවකයින්ට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට අඩුනොවන පුහුණුවක් ලබාදුන් බවට තහවුරු කළ නොහැකිව පැවැතුණි. | අදාළ ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | සේවක පුහුණුව ලබාදීම සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (ඊ) | අනෙකුත් චක්‍රලේඛ 2018.07.19 දිනැති අංක 2018/e පළාත්පාලන - 01 දරන පළාත්පාලන චක්‍රලේඛය | ප්‍රජාවට අන්තර්ජාලය මාර්ගයෙන් සේවාවන් ලබාගැනීමේ පහසුකම් සලසා දී නොතිබුණි. | අදාළ ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව අන්තර්ජාලය සේවාවන් ලබාදීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

### 1.4.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව ඇතැම් ඉඩම් විකුණුම් මත සියයට 1 ක විකුණුම් බදු අයකළ යුතු වුවත්, සභාව විසින් ඒවා අයකිරීමට කටයුතු කර නොතිබුණි. | ලබාගැනීමට කටයුතු කරමින් පවතී. | විකුණුම් බදු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 37,326,758ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 44,440,057 ක් විය. මේ අනුව පසුගිය වර්ෂය සමග සැසඳීමේදී ප්‍රවර්තන වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.7,113,299කින් අඩුවී තිබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 98,100 | 103,269 | 526,081 | 98,100 | 226,795 | 519,328 |
| කුලී | 10,326,600 | 5,745,414 | 17,200 | 10,326,600 | 11,620,300 | 519,328 |
| බලපත්‍ර ගාස්තු | 1,620,300 | 2,727,927 | - | 1,620,300 | 2,134,165 | - |
| වෙනත් ආදායම් | 96,030,400 | 121,345,550 | 52,418,844 | 9,6030,400 | 71,992,688 | 54,725,578 |
| | 120,342,196 | 129,922,160 | 52,962,125 | 108,075,400 | 86,066,991 | 55,275,256 |

## 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| හිඟ වරිපනම් බදු රු. 526,081 ක් අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ හිටි මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | දේපළ හිඟ වරිපනම් බදු මුදල් නියමිත කාලයේදී අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 2.2.3 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු

### 2.2.3.1 උසාවි දඩ මුදල්

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු. 5,197,427 ක් වටිනා උසාවි දඩ මුදල් ලැබිය යුතුව තිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | හිඟ උසාවි දඩ මුදල් නියමිත කාලය තුළ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

### 2.2.3.2 මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු.37,883,307 ක් වටිනා මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි. | හිඟ මුදල් ලබාගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත. | හිඟ මුද්දර ගාස්තු නියමිත කාලය තුළ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව, මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවාවන් සහ පොදු මංමාවත්, මහජන සුබ විහරණය, පහසුකම් හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව මූලික කරුණු 30ක් පිළිබඳව අතුරු ව්‍යවස්ථා ස්ථාපිත කර තිබුණත් එම සියලුම මූලික කාරණාවන් ක්‍රියාත්මක කර නොතිබුණි. | සියලුම මූලික කාරණාවන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. | අතුරු ව්‍යවස්ථාවලින් සඳහන් කළ සියලුම මූලික කාරණාවන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථාවන් ප්‍රකාරව සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 30 ක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාල සභාවට නියමිත අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. |

**(ඇ) මූල්‍ය ප්‍රතිපාදන සලසා නොතිබීම**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සකස් කළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 19 කින් ක්‍රියාකාරකම් 17 ක් සඳහා පමණක් වාර්ෂික අයවැය ප්‍රතිපාදන මගින් අරමුදල් සලසා තිබූ නිසා රු.2,000,000 ක් වටිනා ක්‍රියාකාරකම් 02ක් ක්‍රියාත්මක කළ නොහැකි වී තිබුණි. | සංවර්ධන වැඩසටහන් ප්‍රතිපාදන උපයෝජනය කර කාර්යයන් ක්‍රියාත්මක කරමින් පවතී. | අයවැය සැලැස්මට අනුකූලව ක්‍රියාකාරී සැලැස්ම නියමිත පරිදි සකස් කර මූල්‍ය වර්ෂයේ ක්‍රියාකාරකම් සියල්ල සම්පූර්ණ කළ යුතු වේ. |

**(ඈ) අතහැර තිබූ ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ව්‍යාපෘති මෙහෙයුම් ආරම්භ කිරීමට රු.10,262,245ක් වැය කර තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් අපේක්ෂා කළ ප්‍රතිඵල ළඟා කර නොගෙන එකී ව්‍යාපෘති අතහැර දමා තිබුණි. | ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී. | ව්‍යාපෘති ආරම්භ කිරීමේදි අදාල සැලැසුම් සකස් කර එහි ප්‍රතිලාභ අත්කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

(ඉ)     මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වාහන නැවැතුම්පළ සහ ප්‍රධාන කාර්යාලය ඉදිකිරීමේ ක්‍රියාකාරකම් නියමිත කාලයේ අවසන් කර නොතිබූ බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබාදී නොතිබුණි. | අදාල ක්‍රියාකාරකම් නියමිත කාලයේ අවසන් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

(ඊ)     ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජාතික ප්‍රතිපත්තිය අනුව ඝන අපද්‍රව්‍ය වෙන් නොකර රැස්කර තිබුණි. | සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත. | ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේදි වෙන්කර එකතු කිරීමට කටයුතු කළ යුතු වේ. |

(උ)     පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තෝරාගෙන තිබූ ප්‍රදේශයේ මැසි මදුරුවන් බෝවීම මර්ධනය සඳහා මැසි තෙල් ඉසීම සහ දුර්ගන්ධය වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මැසි මදුරුවන් බෝවීම මර්ධනය සඳහාත් දුර්ගන්ධය වැලැක්වීම සඳහාත් ක්‍රියාමාර්ගයන් ගනිමින් පවතී. | දුර්ගන්ධය වැලැක්වීම සඳහා නියමිත ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

## 3.2     කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ට්‍රැක්ටරයක් පසුගිය වර්ෂ 03ක කාලයක සිට අදාල අවශ්‍යතාවයන් සඳහා උපයෝජනය කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නියමිත අළුත්වැඩියාවන් සිදුකර භාවිතා කිරීමට කටයුතු කරමින් පවති. | වත්කම් නියමිත කාලය තුළ අළුත්වැඩියාවට යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුවේ. |

| | | |
|---|---|---|
| (ආ) උප කාර්යාල 02කට අදාළ දේපල නැවත තක්සේරු කර තිබුණත්, වරිපනම් බදු ලේඛනය නඩත්තු කිරීමට නිසිපරිදි කටයුතු කර නොතිබුණි. | ලේඛන සම්පූර්ණ කිරීමට කටයුතු කරමින් පවතී. | දේපළ නැවත තක්සේරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර වරිපනම් බදු ලේඛන නිසි පරිදි නඩත්තු කළ යුතු වේ. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් විධිමත් අයුරින් මානව සම්පත් ලබාගෙන යොදවා නොතිබු බැවින්, එවැනි මානව සම්පත් 07 ක් විසින් නිම කළයුතු සේවාවන් සියල්ල ප්‍රමාදවී තිබු බව විගණනයේදි නිරීක්ෂණය විය. | කළමනාකරණ සේවා අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ඉල්ලා ඇත. අනුමැතිය ලැබු වහාම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. | තනතුරු පුරප්පාඩු නියමිත කාලයේ පිරවීමට කටයුතු කළ යුතු වේ. |

### 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් JCB, Mortar Grader ආදියෙන් ආදායම් ඉපැයීම් සඳහා භාවිතා කර තිබුණද, එමගින් ලබාගත් ආදායම රු.599,862ක් විය. එසේ වුවත් එහි වියදම් රු.945,007ක්ව පැවැති හෙයින් ආදායමට වඩා වියදම් අධික වී රු.345,745ක පාඩු සිදු වි තිබුණි. | අධිආරක්ෂිත කලාප වශයෙන් පැවැති ප්‍රාදේශ පිරිසිදු කිරීමට මෙම වියදම් සිදු වි තිබුණි. | සභාවේ වත්කම් සභාවට පාඩු සිදුනොවන අයුරින් භාවිතා කිරීම මගින් ප්‍රමාණවත් ආදායමක් උපයා ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

### 3.5 වත්කම් කළමනාකරණය

#### 3.5.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රු.31,901,360 ක් වටිනා වාහන 08 ක් සභාවේ නමට අයිතිය මාරු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | අවශ්‍ය කටයුතු සිදුකර ඇත. | නියමිත කාලය තුළ වාහනවල අයිතිය සභාවේ නමට මාරු කිරීමට සුදුසු කටයුතු සභාව විසින් සිදු කළ යුතු වේ. |
| (ආ) රු.1,026,040 ක් වටිනා මොටර් රථය සභාවේ නමට අයිතිය මාරු කිරීමට අවශ්‍ය කටයුතු කිසිවක් සිදුකර නොතිබුණි. | සභාවේ නමට අයිතිය මාරු කිරීමට කටයුතු කරමින් පවති | නියමිත කාලය තුළ වාහනවල අයිතිය සභාවේ නමට මාරු කිරීමට සුදුසු කටයුතු සභාව විසින් සිදු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (ඇ) රු.47,478,732 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය සභාවේ නමට මාරු කිරීමට අවශ්‍ය කටයුතු කිසිවක් සිදුකර නොතිබුණි. | ලේඛන සහ සාක්ෂි නියමිත පරිදි ලබාගනිමින් පවති. | නියමිත කාලය තුළ ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය සභාවේ නමට මාරු කිරීමට සුදුසු කටයුතු සභාව විසින් සිදු කළ යුතු වේ. |

### 3.5.2 නිෂ්කාර්ය වත්කම්

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක EP JS – 7993 දරන බවුසරය සහ තවත් අංක රහිත බවුසරයක් දිරාපත්වී භාවිතයට නුසුදුසු තත්ත්වයේ පැවතුණි. | බවුසරයට ලියාපදිංචි අංකයක් නොමැති වීම නිසා වෙනස්දේසියේ විකිණීමට නොහැකිව ඇත. | වාහන නියමිත පරිදි නඩත්තු කිරීම් සඳහා කටයුතු සභාව විසින් ගත යුතු වේ. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇස්තමේන්තුගත පුනරාවර්තන වියදම් හා තථ්‍ය වියදම් අතර ප්‍රමාණාත්මක විචලනයක් නිරීක්ෂණය වීම හේතුවෙන් මෙය අයවැය වියදම් ඇස්තමේන්තුවේ අකාර්යක්ෂමතාවය හෙළිදරව් කර තිබුණි. | පිළිතුරු ලබාදි නොතිබුණි. | අයවැය නිවැරදි ආකාරයෙන් සැලසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතු වේ. |